## කුරුවිට ප්‍රාදේශීය සභාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 21 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 22 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 අගෝස්තු 30 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව කුරුවිට ප්‍රාදේශය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, සභාපතිවරයාට යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට කුරුවිට ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාර්ත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ගිණුම් වර්ෂය අවසානයේ ආයතනය තුල ඇති ඖෂධ තොගය හැර අනෙකුත් තොග ගණනය කර ගිණුම් තැබීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 93,253 ක් වූ කලින් ලද ආදායම් ප්‍රමාණයක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයේදී ගෙවීම් කර තිබූ එකතුව රු. 10,770,686 ක් වූ අවස්ථා 30 කට අදාල සමාලෝචිත වර්ෂයේ වියදම් සඳහා ණයහිමි වෙන් කිරීම් සිදු කර නොතිබුණි.

(ඈ) බාහිර ආයතනයකට මූල්‍ය බැදීමකින් තොරව වැය ශීර්ෂ අංක 505(2) යටතේ සෙවිලි තහඩු ලබා දීම සඳහා රු.150,000 ක ණයහිමි වෙන් කිරීමක් සිදු කර සමාලෝචිත වර්ෂයේ වියදම් වලට ගලපා තිබූ බැවින් වගකීමකට අතුලත් නොවී ඉටු නොකල කාර්යයන් සඳහා වියදම් ගිණුම්ගත කිරීම තුලින් වර්ෂයේ ප්‍රාග්ධන වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 57,299,575 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම ව ආදායම රු. 6,077,963 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 605,658 ක් විය.

2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ගිණුම් විෂයයන් 21 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු. 48,574,865 ක් වූ අතර, උපයෝගී ලේඛන අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 32,706,273 ක් විය.

(ආ) ගිණුම් විෂයයන් 04 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු. 53,724,558 ක් වූ අතර, ශේෂ පිරික්සුමට ගෙන ඇති ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 55,322,713 ක් විය.

(ඇ) සභාවේ සේවකයන් වෙනුවෙන් 2009 වර්ෂයේ සිට සභාව මඟින් ගෙවන ලද දේපළ ණය පොළී එකතුව රු. 88,272 ක් පළාත් සභාව මඟින් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) පළාත් පාලන සේවයේ සිටි පැරණි සේවකයින් වෙනුවෙන් සභාව විසින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුව තිබෙන රු. 2,054,598 ක් සමාලෝචිත වර්ෂයේ අවසාන වන විටත් ගෙවා නොතිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000රැ | රු. 000රැ | රු. 000රැ |
| (i) වරිපනම් හා බදු | 2,213 | 2,228 | 3,513 |
| (ii) බදු කුලී | 6,846 | 2,683 | 7,773 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,178 | 1,273 | (69) |
| (iv) වෙනත් ආදායම් | 12,026 | 12,058 | 6,109 |

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| (i) උසාවි දඩ | 2,865,200 |
| (ii) මුද්දර ගාස්තු | 3,206,330 |

2.3.3 වරිපනම් බදු

සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු ඒකක 1834 ක් අතරින් ඒකක 350 ක් සඳහා රු. 2,219,957 ක් වූ වරිපනම් බදු වර්ෂ ගණනාවක සිට හිඟව පැවතුණි.

2.3.4 අක්කර බදු

සභා බල ප්‍රදේශයේ බදු ඒකක 298 ක් සඳහා හිඟ අක්කර ආදායම රු. 194,750 ක් විය.

2.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

සභාව සතු රු. 154,090 ක් වටිනාකමැති බහු කාර්යය කැබලිකරණ යන්ත්‍රයක් භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි.

2.5 අක්‍රිය ගිණුම්

වසර 10 කට වැඩි කාලයක සිට පැවත එන අක්‍රීය ගිණුම් ශේෂ වල එකතුව රු. 59,191 ක් විය.

2.6 අවිධිමත් ගනුදෙනු

බෝපත් ඇල්ල නැරඹුම් මධ්‍යස්ථානයේ 2011 නොවැම්බර් 14 දින සිට 2011 නොවැම්බර් 21 දින දක්වා ප්‍රවේශපත් අලෙවි ආදායම රු. 41,150 ක් වූ අතර 2011 නොවැම්බර් 11 දින පරීක්ෂණ අවස්ථාව වන විට ප්‍රවේශපත් අලෙවිකරු විසින් ප්‍රවේශපත් අලෙවි ආදායමෙන් රු. 36,240 ක් දීර්ඝ කාලයක් තිස්සේ අත රඳවා ගෙන තිබූ අතර රු. 4,910 ක මූල්‍ය ඌනතාවයක් ද නිරීක්ෂණය විය.

2.7 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

I. <u>කුරුවිට දෙල්ගමුව චන්දන මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කුට්ටි අතුරා සකස් කිරීම. (I අදියර)</u>

කර්මාන්තයේ ගිවිසුම්ගත මුදල රු. 499,091 ක් වූ අතර 2011 ජූලි 01 දින වැඩ නිම කර රු.497,850 ක මුදලක් ගෙවා තිබුණි. 2011 නොවැම්බර් 21 දින ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිසි ප්‍රමිතියකින් තොර කොන්ක්‍රීට් කුට්ටි මාර්ගයේ අතුරා තිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව ඉදිකිරීම් නිම කර මාස 03 ක් වැනි කෙටි කාලයක් තුල මාර්ගය අබලන් තත්ත්වයට පත්ව තිබුණි.

II. කුරුවිට උඩකඩ මාර්ගයේ පිවිසුම සකස් කිරීම.

2011 අප්‍රේල් 05 දින මාස 03 ක ගිවිසුම් කාලයක් සඳහා රු. 708,828 ක මුදලකට ගිවිසුමකට එළඹ 2011අප්‍රේල් 08 දින කොන්ක්‍රීට් ගල් අතුරා මාර්ගයේ ඉදිකිරීම් වැඩ නිමවා තිබුණි. මාර්ගයේ අතුරා ඇති කොන්ක්‍රීට් ගල් පිළිබඳව තත්ත්ව පරීක්ෂණ වාර්තාවට අනුව නියුටෝන 25.10 ත්, 54.83 ත් අතර, ශක්තියකින් යුත් කොන්ක්‍රීට් ගල් අතුරා ඇති බවට තහවුරු කර තිබූ නමුත් 2011 නොවැම්බර් 21 දින විගණන පරීක්ෂාවේදී තහවුරු වූයේ මාර්ගය මතුපිට පෘෂ්ඨය පළුදු වීම් වැසීම සඳහා තාර යොදා කොන්ක්‍රීට් පෘෂ්ඨය වසා තිබූ බවයි. ඒ අනුව තත්ත්ව පරීක්ෂණ වාර්තා මගින් තහවුරු කරන ලද තත්ත්වයෙන් යුත් ද්‍රව්‍ය ඉදිකිරීම් සඳහා භාවිතා කලේද යන්න ප්‍රශ්නගත තත්ත්වයක් වූයෙන් ඉදිකිරීම් කටයුතු සඳහා වැය කල රු.708,828 ක මුදලක් නිෂ්කාර්යය තත්ත්වයට පත්ව තිබුණි.

III. කුරුවිට ගල්ලෑලිගම මාර්ගයේ පිවිසුම් සීමාව කොන්ක්‍රීට් කුට්ටි අතුරා සකස් කිරීම. (I අදියර)

අනුමත සමිතියක් සමඟ 2011 ජූලි 06 දින රු. 497,774 ක මුදලකට ගිවිසුමකට එළඹ 2011 සැප්තැම්බර් 02 දින වැඩ නිම කර තිබුණි. 2011 නොවැම්බර් 21 දින කරන ක්ෂේත්‍ර පරීක්ෂාවේදී වැඩ නිම කර මාස 02 ක් ඉක්ම යාමටත් පෙර මාර්ගයේ අතුරන ලද කොන්ක්‍රීට් කට්ටි කැඩී දියවී යාමට ලක්ව ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව නිසි ප්‍රමිතියෙන් යුත් කොන්ක්‍රීට් ගල් මාර්ගය ඉදිකිරීම සඳහා යොදාගත් බවට තහවුරු නොවූ අතර, ඉදිකිරීම් කටයුතු සඳහා වැය කරන ලද රු. 497,774 ක් නිෂ්කාර්යය තත්ත්වයට පත්ව තිබුණි.

2.8 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 සැප්තැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශය අනුව පොදු ගිණුමේ මුදල් ශේෂය රු. 21,531,771 ක් වුවත් එකී අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අවස්ථා 07 කදී එකතුව රු. 345,219 ක් වූ අත්තිකාරම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 (ඇ) ප්‍රකාරව අදාල කාර්යය නිම වූ වහාම පියවාගෙන නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව රු. 1,105,775 ක් වූ ඉකුත් වූ තැන්පතු නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2011 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම හිඟහට් සේවක ණය අත්තිකාරම් ගිණුම් ශේෂ වල එකතුව රු. 426,532 ක් විය.

(ඉ) 2011 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂ වල එකතුව රු. 341,027 ක් වූ අතර අවලව පවතින වත්කම් වල අගය රු. 3,099,542 ක් විය.

(ඊ) 2010 මාර්තු 10 දිනැති අංක පී/එෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂක ජනරාල්වරයාගේ ලිපිය හා 2002 සැප්තැම්බර් 12 හා 2004 පෙබරවාරි 20 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හා 402(1) චක්‍රලේඛ ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මද, ක්‍රියාකාර් සැලැස්මද, වාර්ෂික කාර්යය සාධන වාර්තාවක්ද පිළියෙල කර නොතිබුණ.

3 පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය